සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - 2025

10 ශ්‍රේණිය

භූගෝල විද්‍යාව - I

කාලය පැය 03 යි

නම/ විභාග අංකය:

අමතර කියවීමේ කාලය මිනිත්තු 10 යි.

<u>උපදෙස් :</u>

- මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40 කින් සමන්විත වේ.
- එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

- **ප්‍රශ්න අංක 01 සිට 05 තෙක් දී ඇති ප්‍රශ්නවල එක් එක් ප්‍රශ්නයේ හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

01. මිනිසාගේ පැවැත්ම සඳහා අවශ්‍ය වන ..... ක්‍රියාවලිය සිදුවන්නේ ජෛවගෝලය තුළ ය. (ප්‍රභාසංශ්ලේෂණය / උත්ස්වේදනය / වාෂ්පීකරණය)

02. ලෝකයේ ගැඹුර වැඩිම සාගරික ආගාධ පිහිටා ඇත්තේ ..... සාගරයේ ය. (ඉන්දියන් / අත්ලාන්තික් / පැසිපික්)

03. සමස්ත ගෝලීය ජල ප්‍රමාණයෙන් මිනිසාට භාවිතයට ගත හැකි මතු පිට මිරිදිය ජල ප්‍රමාණය ..... පමණ වේ. (97.5 % / 2.5 % / 1 %)

04. ශ්‍රී ලංකාවට අයත් අනන්‍ය ආර්ථික කලාපය තුළ කෙරෙන ධීවර කර්මාන්තය ..... ධීවර කර්මාන්තයට අයත් වේ. (මිරිදිය / කරදිය / කිවුල් දිය)

05. අධිතාක්ෂණ කර්මාන්තවලට අයත්වන ..... කර්මාන්ත කෙටි කාලයක් තුළ විශාල ආදායමක් ලබන කර්මාන්තයක් බවට පත්ව ඇත. (විද්‍යුත් / පෙට්‍රෝ රසායනික / මොටර් රථ)

- **අංක 06 සිට 10 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශ කියවා එය නිවැරදි නම් 'නි' යන්න වටා ද වැරදි නම් 'වැ' යන්න වටා ද රවුමක් අඳින්න.**

06. ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය සතුව පැවති මිනිරන් කර්මාන්තය වර්තමානයේ පෞද්ගලික අංශය මගින් පවත්වාගෙන යයි. (නි / වැ)

07. දේශගුණය පිළිබඳ පැහැදිලි අදහසක් ලබා ගැනීම සඳහා අවම වශයෙන් වසර 30 ක පමණ කාලගුණික දත්ත අධ්‍යයනය කළ යුතුයි. (නි / වැ)

08. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය නගා සිටුවීම සඳහා 'දිවි නැගුම' හා 'ගැමි දිරිය' වැනි වැඩසටහන් හඳුන්වා දී ඇත. (නි / වැ)

09. සංචාරක අධිකාරිය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංචාරක කලාප 06 ක් හඳුනාගෙන ඇත. (නි / වැ)

10. 1 : 50, 000 භූ ලක්ෂණ සිතියමක පූර්ණ ඊතලයක් සහිත සිරස් රේඛාවෙන් සැබෑ උතුර දක්වා ඇත. (නි / වැ)

අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචනය යොදා සම්පූර්ණ කරන්න.

11. මුදුන් කිහිපයක් සහිත විවිධ බෑවුම් වලින් සහ ඉහළ උන්නතාංශයකින් යුත් එකදිගට විහිදෙන භූ රූප ..... නම් වේ.

12. පෘථිවියේ භූ තැටි ප්‍රාවරණය තුළ ක්‍රියාත්මක වන .....වල බලපෑමෙන් චලනය වේ.

13. ශ්‍රී ලංකාව විසින් අපනයන කරන මිනිරන් වැඩිම ප්‍රමාණයක් මිල දී ගන්නා රට ..... යයි.

Past Papers Wiki

14. ශ්‍රී ලංකාවේ මයික්‍රෝ වාහන එකලස් කිරීමේ කර්මාන්ත ශාලාවක් ..... පිහිටුවා ඇත.

15. පාථිවිය වටා පිහිටි විවිධ වායු වර්ගවලින් සමන්විත තුනී ස්ථරය ..... ලෙස හඳුන්වයි.

- **අංක 16 සිට 19 තෙක් ප්‍රශ්නවල 'අ' සහ 'ආ' යනුවෙන් තීරු දෙකක් දැක්වේ. 'අ' තීරුවේ ඇති තොරතුරුවල අනුපිළිවෙළට ''ආ'' තීරුවේ ඇති තොරතුරු ගැලපූ විට නිවැරදි අනුපිළිවෙල දැක්වෙන පිළිතුරට හිමි අංකය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

16.

'අ' තීරුව කඳු වැටි		'ආ' තීරුව මහාද්වීපය	
(1)	ඇපලාචියන්	A	අප්‍රිකා
(2)	ඇට්ලස්	B	ආසියා
(3)	අල්තායි	C	උතුරු ඇමරිකා
		D	දකුණු ඇමරිකා

(1) CA D (2) BAD (3) CAB (4) ABC (.....)

17.

'අ' තීරුව ආරම්භක ස්ථානය		'ආ' තීරුව ගංගාව	
(1)	ග්ලැසියර් දිය වූ ජලයෙන්	A	ඩැනියුබ්
(2)	විලකින්	B	තේම්ස්
(3)	උල්පතකින්	C	නයිල්
		D	රයින්

(1) ACB (2) DCB (3) CAD (4) DCA (.....)

18.

'අ' තීරුව සාගරය		'ආ' තීරුව පිහිටි මුහුදු	
(1)	අත්ලාන්තික්	A	කහ මුහුදු
(2)	පැසිපික්	B	කැරිබියන් මුහුදු
(3)	ආක්ටික්	C	බොෆට් මුහුදු
		D	බැරන්ට්ක් මුහුදු

(1) BAC (2) DCB (3) ACD (4) BAD (.....)

19.

'අ' තීරුව වායුගෝලීය ස්තරය		'ආ' තීරුව ගති ලක්ෂණ	
(1)	පරිවර්තීගෝලය	A	වායු ගෝලයේ අඩුම උෂ්ණත්වය පවතී.
(2)	අපරවර්තීගෝලය	B	කාලගුණ සංසිද්ධි සිදු වේ.
(3)	මේසෝගෝලය	C	ඕසෝන් ස්ථරය පිහිටා ඇත.
		D	වායු පරිමාව ඉතාම අඩුය.

(1) BDA (2) ACD (3) BCA (4) ADC (.....)

20.

'අ' තීරුව භෝග වර්ගය		'ආ' තීරුව පර්යේෂණ මධ්‍යස්ථානය පිහිටි ප්‍රදේශය	
(1)	සුළු අපනයන භෝග	A	ලුණුවිල
(2)	පොල්	B	බෝඹුවල
(3)	වී	C	මාතලේ
		D	අගලවත්ත

(1) CAB (2) CDB (3) BAD (4) CBD (.....)

21.

'අ' තීරුව	'ආ' තීරුව
යකඩ හා වානේ නිෂ්පාදිත ප්‍රදේශ	ප්‍රදේශය පිහිටි රට
(1) දකුණු වේල්ස්	A රුසියාව
(2) මොස්කව් ද්‍රෝණි කලාපය.	B ඇමරිකා එක්සත් ජනපදය
(3) පීට්ස්බර්ග් කලාපය	C එක්සත් රාජධානිය
	D චීනය.

(1) CAD (2) BAC (3) BDA (4) CAB (.....)

- අංක 22 සිට 24 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත ප්‍රස්තාර සටහන යොදා ගන්න.



22. වැඩිම නිෂ්පාදනය සහ වැඩිම වෙළඳාමකට හිමිකම් ඇත්තේ ..... ට ය.

23. 2008 වර්ෂයේ දී වැඩිම නිෂ්පාදනයක් සහ අඩුම වෙළඳාමක් හිමි රට ..... වේ.

24. 2008 වර්ෂයේ දී නිෂ්පාදනයට වඩා වෙළෙඳාම ඉහළ අගයක් ගනු ලබන රට ....යි.

- **අංක 25 සිට 26 තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

25. ඕස්ට්‍රේලියා මහාද්වීප තටකය තුළ පිහිටි දූපතකට නිදසුනක් වන්නේ කුමන දූපත ද?

(1) සුමාත්‍රා (2) බෝර්නියෝ (3) පැපුවානිව්ගිනියාව (4) ශ්‍රී ලංකාව (.....)

26. පහත දැක්වෙන ලක්ෂණ වලින් කියැවෙන දේශගුණ වර්ගය කුමක් ද?

★ වාර්ෂික වර්ෂාපතනය 250mm - 300 mm පමණ වේ.

★ තුහින හා හිම පතනය සිදු වේ.

★ ඉහළ අක්ෂාංශිය ප්‍රදේශවල ව්‍යාප්ත වේ.

(1) ශීත දේශගුණය. (2) මධ්‍යධරණී දේශගුණය.

(3) නිවර්තන දේශගුණය. (4) සෞම්‍ය දේශගුණය. (.....)

27. පෘථිවි ස්කන්ධයෙන් $\frac{2}{3}$ ක් පමණ අයත් වන්නේ,
(1) කබොලටය. (2) අභ්‍යන්තර හරයටය. (3) බාහිර හරයටය. (4) ප්‍රාවරණයටය. (.....)

28. ශ්‍රී ලංකාවේ සුළු අපනයන බෝග හා සම්බන්ධ නොගැලපෙන පිළිතුර තෝරන්න.
(1) ගම්මිරිස් - මොණරාගල (2) මල් වර්ග - නුවරඑළිය
(3) කරාබුනැටි - මාතලේ (4) කජු - මන්නාරම (.....)

29. පිඟන් භාණ්ඩ, සනීපාරක්ෂක කට්ටල, විසිතුරු භාණ්ඩ වැනි භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ඛණිජය කුමක් ද?
(1) මිනිරන් (2) කෙඔලින් (3) ඉල්මනයිට් (4) හුණුගල් (.....)

30. ★ ලෝම ලැටරයිට් පස. ★ $15\,C^{o}$ - $27\,C^{o}$ දක්වා සාමාන්‍ය උෂ්ණත්වය
★ 1900 mm - 540 mm දක්වා වූ වර්ෂාපතනය
ඉහත සඳහන් භෞතික සාධක වඩාත් යෝග්‍ය වගාව කුමක් ද?
(1) පොල් ය. (2) ඉරිඟු ය. (3) තේ ය. (4) තිරඟු ය. (.....)

31. ශ්‍රී ලංකාවේ මිරිදිය මසුන් බෝ කරන මධ්‍යස්ථානයක් වන්නේ,
(1) මාන්කුලම (2) පිටිපන (3) ඉහිනියාගල (4) අනුරාධපුර (.....)

32. සංචාරක කලාප අතුරෙන් පුරාණ නගර කලාපයට අයත් වන නගර දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) සීගිරිය, දඹුල්ල, මහනුවර (2) නුවරඑළිය, මහනුවර, කුරුණෑගල
(3) ත්‍රිකුණාමලය, පොළොන්නරුව, මඩකලපුව (4) අනුරාධපුරය, පොළොන්නරුව, වව්නියාව
(.....)

33. A. ප්‍රවාහනය කරන ද්‍රව්‍ය අනුව සුවිශේෂී නිෂ්පාදන නිර්මාණය කිරීම.
B. කෘෂි පාදක අමු ද්‍රව්‍ය මත පදනම් වීම.
C. පරිසර දූෂණ අවම වන පරිදි පරිසර හිතකාමී නිෂ්පාදන කිරීම.
D. නිෂ්පාදනය සඳහා යොදා ගන්නා බලශක්ති සම්පත් වෙනස් වීම.
ඉහත දැක්වෙන ලක්ෂණ අතුරින් මෝටර් රථ කර්මාන්තයේ ප්‍රවණතා දෙකක් දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A හා D (2) B හා D (3) C හා D (4) A හා C (.....)

34. ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත බෝට්ටු අපනයන කරන රටවල් දෙකක් දැක්වෙන පිළිතුර වන්නේ,
(1) ඉන්දියාව, සුමාත්‍රා (2) මාලදිවයින, ඉන්දියාව
(3) නෝර්වේ, ස්වීඩනය (4) සිංගප්පූරුව, පිලිපීනය (.....)

35. 1 : 50 000 භූ ලක්ෂණ සිතියම්වල සමෝච්ඡ රේඛා මඟින් නිරූපණය කළ හැකි ලක්ෂණ පමණක් ඇතුළත් පිළිතුරු කුමක් ද?
(1) නෙරුව, වනාන්තර, කඳුවැටි (2) කඳුවැටි, වැව, ගංගාව
(3) නිම්නය, නෙරුව, කපොල්ල (4) ගංගාව, නිම්නය, කපොල්ල (.....)

36. තේමා සිතියමට නිදසුනක් නොවන්නේ,
(1) ශ්‍රී ලංකාවේ මාර්ග සිතියම. (2) ශ්‍රී ලංකාවේ සංචාරක ප්‍රදේශ.
(3) අප්‍රිකාවේ භූ විෂමතා හා ගංගා සිතියම. (4) ආසියාවේ ජන ඝණත්ව සිතියම. (.....)

37. ශ්‍රී ලංකාවේ 1 : 50000 භූ ලක්ෂණ සිතියමක ඉහළ වට තීරුවේ සඳහන් නොවන තොරතුරක් වන්නේ,
(1) සිතියම් වර්ගය (2) සිතියමේ නම
(3) සිතියමේ අංකය (4) සිතියමේ පරිමාණය (.....)

- **පහත A B C හා D වලින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගලය හොඳින් අධ්‍යයනය කර අංක 38 සිට 40 තෙක් දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A 1. ජනගහනය
2. පරිසරය

B 1. ගෝලීය උණුසුම
2. වන විනාශය

C 1. වන සංරක්ෂණය
2. ජල පෝෂක ප්‍රදේශය

D 1. වියපත් වීම.
2. මරණ අනුපාතය.

38. පළමුවැන්නේ සාර්ථකත්වය දෙවැන්නේ පැවැත්මට හිතකර වන මාතෘකා යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D (.....)

39. පළමුවැන්නේ වැඩිවීම දෙවැන්නට අහිතකර ලෙස බලපාන මාතෘකා යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D (.....)

40. පළමුවැන්නේ වැඩිවීමට දෙවැන්නේ අඩුවීම අහිතකර ලෙස බලපාන මාතෘකා යුගලය දැක්වෙන්නේ,
(1) A (2) B (3) C (4) D (.....)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - 2025

10 ශ්‍රේණිය

භූගෝල විද්‍යාව - II

නම/ විභාග අංකය:

- **මෙම ප්‍රශ්න පත්‍රය I, II වශයෙන් කොටස් දෙකකි. I කොටසේ ප්‍රශ්නය අනිවාර්යයේ. එහි (අ), (ආ) සහ (ඉ) කොටස් තුනටම පිළිතුරු සැපයිය යුතුය. II කොටසින් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයිය යුතුය. පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05 කි.**

I - කොටස

(01) (අ) ඔබ වෙත සපයා ඇති භූ ලක්ෂණ සිතියම් කොටස හොඳින් අධ්‍යයනය කර ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අංක i සිට v දක්වා ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න. (ල. 05)

(i) A චතුරස්‍රය තුළ දැක්වෙන භෞතික ලක්ෂණය කුමක් ද?

(කඳු වැටිය / හුදකලා කන්ද / කොත් කන්ද)

(ii) B චතුරස්‍රය තුළ දැක්වෙන කෘෂි භූමි පරිභෝගය කුමක් ද?

(වී / වෙනත් වැවිලි / පොල්)

(iii) E අක්ෂරයෙන් දැක්වෙන පරිපාලන මායිම වන්නේ,

(උස දිශාපති කොට්ඨාශ මායිමකි / ග්‍රාම නිලධාරී කොට්ඨාශ මායිමකි. / නගරසභා මායිමකි.)

(iv) G අක්ෂරයෙන් දැක්වෙන්නේ,

(මාර්ගයකි / වාරි ඇළකි / අතු ගංගාවකි)

(v) H අක්ෂරයෙන් දැක්වෙන්නේ,

(ළඳු කැලෑ / වනාන්තර / හේන)

(vi) C - D රේඛාවෙන් දැක්වෙන භූ ලක්ෂණය නම් කරන්න. (ල. 01)

(vii) සිතියම් ප්‍රදේශය තුළ දක්නට ලැබෙන ඕනෑම රාජ්‍ය ආයතන 02 ක් නම් කරන්න.(ල. 02)

- පහත සඳහන් ප්‍රකාශ නිවැරදි නම් 'නි' යන්න ද වැරදි නම් 'වැ' යන්න ද සඳහන් කරන්න. (ල. 02)

(viii) (a) සිතියම් ගත ප්‍රදේශයේ විසිරුණු ජනාවාස රටාවක් පවති. (නි / වැ)

(b) ගිණිකොන දිග කාර්තුවේ අරිය ජලවහන රටාවක් පවති. (නි / වැ)

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබදව ඇති තීරුව යොදා ගන්න.

අංක i සිට v තෙක් එක් එක් ප්‍රශ්නය ඉදිරියේ දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරෙන් නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා යාබදව ඇති තීරුවේ එක් එක් ප්‍රශ්න අංක ඉදිරියෙන් ඇති කොටුව තුළ ලියා දක්වන්න.

(i)	යුක්‍රේනය	A , B , C
(ii)	මෙක්සිකෝ බොක්ක	D , E , F
(iii)	ඩ්‍රැගන්බර්ගග් කඳුවැටිය	G , H , I
(iv)	ෆෝක්ලන්ඩ් දූපත්	J , K , L
(v)	යෙනිසි ගඟ	M , P , S

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකා සිතියමට යාබදව ඇති තීරුව යොදා ගන්න.

- අංක i සිට v තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරෙන් නිවැරදි පිළිතුරු දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා සිතියමට යාබදව ඇති තීරුවේ එක් එක් ප්‍රශ්න අංක ඉදිරියෙන් ඇති කොටුව තුළ ලියා දක්වන්න.

(i)	කෝකිලායි කලපුව	(A B C)
(ii)	රම්බොඩගල්ල	(E F G)
(iii)	ලුණුවිල	(H I J)
(iv)	පර්ල් මුතුපරය	(K L M)
(v)	පොල් ත්‍රිකෝණයට අයත් මිල්දෙණිය	(N O P)

II - කොටස

02. පහත දැක්වෙන්නේ ශිලා ගෝලයට අයත් රූප සටහනකි.



(i) ශිලා ගෝලයට අයත් A හා B අක්ෂර වලින් දැක්වෙන කොටස් නම් කරන්න. (ල. 02)

(ii) (a) ඉහත ඔබ නම් කළ A ස්ථරය නිර්මාණ වී ඇති පාෂාණ වර්ගයක් නම් කරන්න.

(b) රූප සටහනේ C අක්ෂරයෙන් දැක්වෙන කොටස නම් කරන්න.

(c) පෘථිවි කබොල ප්‍රාවරණයෙන් වෙන්කරන සීමාව හඳුන්වන නම ලියන්න. (ල. 03)

(iii) (a) පෘථිවි පෘෂ්ඨය නිර්මාණය වී ඇති ප්‍රධාන තැටි දෙකක් නම් කරන්න.

(b) ශිලාගෝලයේ ඇති සම්පත් මිනිසා විසින් ප්‍රයෝජනයට ගැනීමේ දී ශිලාගෝලයට ඇති වන බලපෑම් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

03. (i) ජෛව ගෝලයේ ප්‍රධාන සංරචක දෙක නම් කරන්න. (ල. 02)

(ii) ජෛව ගෝලයේ සමතුලිතතාවය බිඳවැටීම හේතු වී ඇති මානව ක්‍රියාකාරකම් තුනක් ලියන්න. (ල. 03)

(iii) (a) ජෛව ගෝලයට වඩාත් වැදගත් වන වායු ස්ථරය නම් කරන්න.

(b) වායු ගෝලය දූෂණය වීම නිසා මිනිසාට අත්විඳීමට සිදුවන ප්‍රතිඵල දෙකක් ලියන්න.

(c) මිනිස් ක්‍රියාකාරකම් නිසා වායුගෝලය දූෂණය වීමෙන් භෞතික හා මානව පරිසරයට සිදුවන බලපෑම අවම කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

04. (i) පහත දක්වා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි,



(a) උඩරට තේ වගාව සඳහා වැදගත්වන දිස්ත්‍රික්කයක් දැක්වෙන අක්ෂරය ද,

(b) රබර් වගාව සඳහා වඩාත් වැදගත්වන දිස්ත්‍රික්කයක් දැක්වෙන අක්ෂරය ද පිළිවෙලින් ලියන්න. (ල. 02)

(ii) ශ්‍රී ලංකාවේ රබර් වගාව ව්‍යාප්ත වීම සඳහා බලපා ඇති පහත දැක්වෙන භෞතික සාධක ලියා දක්වන්න. (ල. 03)

(a) පස

(b) උෂ්ණත්වය

(c) වර්ෂාපතනය

(iii) (a) ශ්‍රී ලංකාවේ තේ වගාව ආශ්‍රිතව පැනනැගී ඇති නිෂ්පාදනය ආශ්‍රිත ගැටළු දෙකක් ලියන්න.

(b) ශ්‍රී ලංකාවේ තේ වගාව ආශ්‍රිත ගැටළු විසඳීමට රජය ගෙන ඇති ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

05. (i) ශ්‍රී ලංකාවේ පහත සඳහන් ප්‍රදේශවල ඇති ගෘහාශ්‍රිත කර්මාන්ත දෙකක් ලියන්න. (ල. 02)

(a) වේවැල්දෙණිය (b) පිළිමතලාව

(ii) ගෘහ ආශ්‍රිත කර්මාන්තවල කැපී පෙනෙන ලක්ෂණ 03 ක් ලියන්න. (ල. 03)

(iii) (a) සාම්ප්‍රදායික ගෘහ ආශ්‍රිත කර්මාන්ත වර්තමානයේ මුහුණ දී ඇති ගැටළු දෙකක් ලියන්න.

(b) ගෘහ ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග දෙකක් පැහැදිලි කරන්න. (ල. 05)

- **06 සහ 07 ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන සිතියම උපයෝගී කර ගන්න.**



06. (i) (a) මුල්කාලයේ දී නැව් තැනීමේ කර්මාන්තයට ප්‍රසිද්ධ රටක් A අක්ෂරයෙන් ද,

(b) වර්තමානයේ නැව් නිෂ්පාදනයේ ප්‍රමුඛයන් වී සිටින රටක් B අක්ෂරයෙන් ද දැක්වේ. එම රටවල් දෙක පිළිවෙළින් නම් කරන්න. (ල. 02)

(ii) නැව් තැනීමේ කර්මාන්තය ආරම්භයේ දී පැවතියේ සංවර්ධිත රටවල පමණි. ඒ සඳහා බලපෑ හේතු 03 ක් ලියන්න. (ල. 03)

(iii) (a) සිතියමේ හි C අක්ෂරයෙන් දැක්වෙන විද්‍යුත් කර්මාන්තය සඳහා වැදගත් වන රට කුමක් ද?

(b) ලෝක විද්‍යුත් උපාංග නිෂ්පාදනය සඳහා චීනයෙන් වැඩිම දායකත්වයක් සැපයූ විද්‍යුත් නිෂ්පාදන දෙකක් ලියන්න.

(c) ශ්‍රී ලංකාවේ විද්‍යුත් කර්මාන්තයේ ප්‍රවණතා දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

07. (i) (a) සිතියමෙහි E අක්ෂරයෙන් දැක්වෙන තිරිඟු වගා කරන රට ද,

(b) F අක්ෂරයෙන් දැක්වෙන වී වගා කරන රට ද නම් කරන්න. (ල. 02)

(ii) තිරිඟු වගාව ආශ්‍රිත විශේෂ ලක්ෂණ තුනක් ලියන්න. (ල. 03)

(iii) (a) ශ්‍රී ලංකාවේ වී වගා කරන තෙත් කලාපයට අයත් දිස්ත්‍රික්ක දෙකක් ලියන්න.

(b) ශ්‍රී ලංකාවේ වී වගාව ආශ්‍රිත පැන නැගී ඇති ගැටළු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

08. (i) (a) තේමා සිතියමක් යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

(b) තේමා සිතියමක ඇති වාසියක් ලියන්න. (ල. 02)

(ii) වර්තමානයේ දී සිතියම් සඳහා භාවිත කරන නව තාක්ෂණික ශිල්ප ක්‍රම තුනක් ලියන්න. (ල. 03)

(iii) (a) භූ ලක්ෂණ සිතියමක ඇතුළත් වන ප්‍රධාන ලක්ෂණ දෙක ලියන්න.

(b) භූ ලක්ෂණ සිතියමක ඇති ප්‍රයෝජන දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

PAST PAPERS WIKI



(i) ☐

(ii) ☐

(iii) ☐

(iv) ☐

(v) ☐

/5

01 (ඉ) / (C)



(i) ☐

(ii) ☐

(iii) ☐

(iv) ☐

(v) ☐

/5

01 (අ) (A) ___/10 + (ආ) (B) ___/5 + (ඉ) (C) ___/5 = ___/20

භූගෝල විද්‍යාව II
புவியியல் II
Geography II

ශ්‍රේණිය/Grade : .....

විභාග අංකය
சுட்டெண்
Index Number .....

පරීක්ෂකවරයාගේ
ප්‍රයෝජනය පිණිසයි.
பரீட்சகரின் உபயோகத்
துக்கு மட்டும்
For Examiner's
Use Only

(01) (අ)

(i) .....

(ii) .....

(iii) .....

(iv) .....

(v) .....

(vi) .....

(vii) .....
.....

(viii) (a) .....

(b) .....

10

පිළිතුරු පත්‍රය - I පත්‍රය

01	ප්‍රභාසංස්ලේෂණය	11	කඳුවැටි	21	4	31	2
02	පැසිපික්	12	සංවහනධාරා	22	යුරෝපය	32	1
03	1%	13	ජපානය	23	චීනය	33	4
04	කරදිය	14	පොල්ගහවෙල	24	උතුරු ඇමරිකාව	34	2
05	විද්‍යුත්	15	වායුගෝලය	25	3	35	3
06	නි	16	3	26	1	36	3
07	නි	17	2	27	4	37	4
08	නි	18	4	28	1	38	3
09	වැ	19	3	29	2	39	1
10	වැ	20	1	30	3	40	2

II පත්‍රය

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්) (ලකුණු 40)

I - කොටස

(01) (අ) (i) හුදකලා කන්ද (ii) වී (iii) උප දිසාපති කොට්ඨාශ (iv) වාරි ඇළකි.
(v) හේන (vi) නිම්නය / ගංගා නිම්නය
(vii) පාසල, යුදහමුදා කඳවුර, වී අලෙවි මධ්‍යස්ථානය, තැපැල් කාර්යාලය, රෝහල, පශු වෛද්‍ය කාර්යාලය, වාරි මාර්ග සංවර්ධන කාර්යාලය, පුහුණු මධ්‍යස්ථානය, තානායම
(vii) (a) නි (b) නි

(අ) (i) B (ii) F (iii) H (iv) L (v) S

(ඉ) (i) A (ii) G (iii) J (iv) M (v) P

02. (i) A - මහාද්වීපික කබොල
B - සාගරික කබොල (ලකුණු 02)

(ii) (a) - ග්‍රැනයිට් (ලකුණු 01)
(b)- ශිලාගෝලය (ලකුණු 01)
(c) - මෙහොරොවිසික් ආසන්නතිය (ලකුණු 01)

(iii) (a) අප්‍රිකානු තැටිය / උතුරු ඇමරිකානු තැටිය / දකුණු ඇමරිකානු තැටිය / යුරේෂියානු තැටිය / ඉන්දු ඔස්ට්‍රේලියානු තැටිය / ඇන්ටාර්ටික් තැටිය / පැසිපික් තැටිය යන ඒවායින් දෙකක් ලියා ඇත්නම් ලකුණු 2 යි.

(b) ★ ඛණිජ සම්පත් ලබා ගැනීමට පොළොව කැණීමේ දී සිදුවන භූමි හායනය.
★ වනාන්තර එළි කිරීම නිසා භූමිය නිරාවරණය වීමෙන් පාංශු ඛාදනය තීව්‍ර වීම.
★ මතුපිට භූ දර්ශනය වෙනස් වීම.
★ භූ ගත ජලය මට්ටම වෙනස් වීම.
★ කර්මාන්ත ශාලා සහ ගෘහස්තව සිදුවන අපද්‍රව්‍ය බැහැර කිරීම මගින් ශිලාගෝලයේ ඇතැම් ස්තරවලට හානි සිදු වීම. වැනි බලපෑම් දෙකක් ලියා ඇත්නම් ලකුණු 02 යි. පැහැදිලි කිරීමට ලකුණු 01 යි. මුළු ලකුණු 03 යි.

03. (i) ජීවී සංරචක සහ අජීවී සංරචක (ලකුණු 02)

(ii) ★ වනාන්තර විනාශ වීම.
★ වනාන්තර ගිනි තැබීම.
★ අප ද්‍රව්‍ය මුදා හැරීම.
★ වන සතුන් දඩයම් කිරීම.
★ රක්ෂිත භූමි වල හේන් වගාව.
★ ඉඩම් ගොඩ කිරීම (වගුරු බිම්) වැනි ක්‍රියාකාරකම් තුනක් ලියා ඇත්නම් ලකුණු 03 යි.

(iii) (a) පරිවර්ති ගෝලය (ලකුණු 01)

(b) ★ ගෝලීය උණුසුම ඉහළයාම.
★ වර්ෂාපතන රටාව වෙනස් වීම.
★ සුළං රටාව වෙනස් වීම.
★ කාලගුණික උපද්‍රව ඇති වීම. (සුළි සුළං, ගංවතුර, නියඟ)
★ හිමකඳු දියවීම වැනි ලක්ෂණවලට ලකුණු 02 යි.

Past Papers Wiki

(c) ★ වන වගාව. / පැල සිටුවීම. ★ පරිසර හිතකාමී වාහන නිෂ්පාදනය
★ අහිතකර වායු වර්ග මුදා නොහැරීම. ★ කාබන් විමෝචනය අවම කිරීම
★ කර්මාන්තශාලාවල දුම් ඉහළ වායුගෝලයට මුදා හැරීම.
★ ජනතාව දැනුවත්කිරීම වැනි නිවැරදි ක්‍රියාකාරකම් දෙකක් ලියා පැහැදිලි කිරීමට ලකුණු 02 යි.

04. (i) (a) C (ii) (b) A

(ii) (a) කබොක් මිශ්‍ර රතු පස. (b) $27C^0$ පමණ සාමාන්‍ය උෂ්ණත්වය

(c) 2000mm වැඩි වර්ෂාපතනය (ලකුණු03)

(iii) (a) ★ වතු පැරණි වීම නිසා අස්වැන්න අඩු වීම.
★ ඉඩම් කැබලිවීම.
★ බිම් ඒකකයකින් ලබා ගන්නා අස්වැන්න අඩු වීම.
★ පුහුණු ශ්‍රම හිඟය.
★ කර්මාන්තශාලා නවීකරණය නොවීම.
★ කම්කරු ගැටළු හා වෘත්තීය සමිති ගැටළු වැනි ඒවායින් දෙකක් ලියා ඇත්නම් ලකුණු 02 යි.

(b) ★ වෙළඳපොල සේවා පුළුල් කිරීම.
★ පොහොර සහනාධාර සැපයීම.
★ නැවත වගා කිරීම සඳහා සහනාධාර ලබා දීම.
★ දෛනික වැටුප ඉහළ දැමීම වැනි ක්‍රියාමාර්ග දෙකක් ලියා කෙටියෙන් පැහැදිලි කර ඇත්නම් ලකුණු 03 යි.

05. (i) (a) වේවැල් භාණ්ඩ (b) පිත්තල භාණ්ඩ (ලකුණු 02)

(ii) ★ පවුලේ ශ්‍රමය යොදා ගනී.
★ දේශීය අමුද්‍රව්‍ය මත පදනම් වේ.
★ සාම්ප්‍රදායික දැනුම යොදා ගනී.
★ ව්‍යවසායකයාගේ නිවස හෝ ඒ ආශ්‍රිතව පවත්වාගෙන යයි.
★ කුඩා අත්යන්ත්‍ර භාවිත කරයි.
★ සුළු ආයෝජනයක් සහිතයි. වැනි ලක්ෂණ තුනකට ලකුණු 03 යි.

(iii) (a) ★ අමු ද්‍රව්‍ය හිඟය.
★ නිෂ්පාදනවලට නියමිත මිලක් නොමැති වීම.
★ ආදේශක භාණ්ඩවලින් එල්ලවන තරගය
★ ශ්‍රමය හිඟවීම.
★ නිෂ්පාදන වියදම් ඉහළ යාම වැනි ගැටළුවලින් දෙකක් ලියා ඇත්නම් ලකුණු 02 යි.

(b) ★ දිවි නැගුම ජාතික සංවර්ධන වැඩසටහන
★ කර්මාන්ත ගම්මාන ඇති කිරීම.
★ හස්ත කර්මාන්ත සංවර්ධන වැඩසටහන
★ ගෘහ කර්මාන්තය සඳහා ශ්‍රමිකයන් පුහුණු කිරීම.
★ ප්‍රදර්ශන පැවැත්වීමෙන් නිෂ්පාදිතයින් දෙර්මත් කිරීම. වැනි ක්‍රියාමාර්ග දෙකක් ලියා ඇත්නම් ලකුණු 02 යි. පැහැදිලි කිරීමට ලකුණු 1 යි.

06. (i) (a) මහා බ්‍රිතාන්‍යය. (b) දකුණු කොරියාව (ලකුණු 02)

(ii) ★ විශාල ප්‍රාග්ධනයක් ආයෝජනය කළ හැකි වීම.
★ අමුද්‍රව්‍ය ලෙස යකඩ හා වානේ පහසුවෙන් ලබාගත හැකි වීම.
★ කීර්ති නාමය හා පළපුරුද්දක් තිබීම. (ලකුණු 03)

(iii) (a) ජපානය (ලකුණු 01) (b) ලේසර් සංයුක්ත තැටි / අංකිත කැමරා (ලකුණු 02)

(c) ★ විශාල වශයෙන් විද්‍යුත් නිෂ්පාදන ආශ්‍රිත ඍජු හා වක්‍ර රැකියා අවස්ථා බිහිවීම.
★ විද්‍යුත් උපකරණ අලුත්වැඩියා සහ සේවා මධ්‍යස්ථාන බහුලව ව්‍යාප්ත වීම.
★ අවශ්‍ය විශේෂඥ ශ්‍රමිකයන් බිහි කරන උසස් අධ්‍යාපන ආයතන හා පාසල් විෂයමාලා සකස් වීම.
★ ආනයනික විද්‍යුත් උපකරණවල ගුණාත්මක තත්වය හා තාක්ෂණය දේශීය නිෂ්පාදනවලට එකතු වීම.
★ එකලස් කිරීමේ කර්මාන්තය බොහෝවිට නාගරික ප්‍රදේශවල ස්ථානගත වීම. වැනි ප්‍රවණතා දෙකක් ලියා කෙටියෙන් පැහැදිලි කර ඇත්නම් ලකුණු 02 යි.

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

07. (i) (a) චීනය

(b) තායිලන්තය

(ii) ★ බිම් ඒකකයකට ලැබෙන අස්වැන්න අඩුවූව ද තිරිඟු වගා කළ ප්‍රදේශවල ජන සංඛ්‍යාව අඩුවීම නිසා ඒක පුද්ගල අස්වනු ප්‍රමාණය වැඩිය.

★ ඒක භෝග වගාවක් වීම.

★ වගාබිම් විශාල වීම.

★ දියුණු තාක්ෂණික ශිල්ප ක්‍රම භාවිතය.

★ පැතිරුණු වෙළෙපලක් පැවතීම.

★ මහ පරිමාණ වශයෙන් යාන්ත්‍රිකරණයට භාජනය වීම.

★ වැඩි ඵලදායක් සහිත තිරිඟු වර්ග භාවිතය.

★ විවිධාකාරයෙන් සැකසූ ආහාර ලෙස තිරිඟු පරිභෝජනය කිරීම. වැනි ලක්ෂණ තුනක් ලියා ඇත්නම් ලකුණු 03 යි.

(iii) (a) ගාල්ල, කළුතර, රත්නපුර, කොළඹ, ගම්පහ, තංගල්ල යන දිස්ත්‍රික්ක වලින් 02 ක් ලිවිය යුතුයි. ලකුණු 02 යි.

(b) ★ ඉඩම් හිඟය හා ඉඩම් කැබලි වී යාම.

★ එකම බිමක දීර්ඝ කාලීනව වගා කටයුතු සිදු කිරීම නිසා අස්වැන්න අඩු වීම.

★ බිම් ඒකකයකින් ලබා ගන්නා අස්වැන්න අඩුවීම.

★ වියළි කලාපීය ප්‍රදේශවල ජල හිඟය. / තෙත් කලාපීය ප්‍රදේශවල ජල අතිරික්තය

★ පොහොර මිල ඉහලයාම.

★ තරුණ පරපුර කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ රැකියාවලට අකමැති වීම.

★ නිෂ්පාදන මිල දී ගැනීමේ මධ්‍යස්ථාන ප්‍රමාණවත් නොවීම. වැනි වී වගාවට සම්බන්ධ ගැටළු දෙකක් ලියා ඇත්නම් ලකුණු 02 යි. කෙටියෙන් පැහැදිලි කිරීමට ලකුණු 01 යි.

08. (i) (a) එක් සුවිශේෂී කරුණක් දැක්වීම සඳහා පමණක් නිර්මාණය කර ඇති සිතියම් වේ. ලකුණු 01 යි.

(b) ★ සිතියම පහසුවෙන් වටහා ගත හැකි වීම.

★ විවිධ තේමා සිතියම් එකිනෙක හා සම්බන්ධ කිරීමේ හැකියාව.

★ සැලසුම් සකස් කිරීමේ දී භාවිත කිරීම.

★ ප්‍රාදේශීය හෝ අවකාශීය රටාව හොඳින් අවබෝධ කර ගත හැකි වීම.

★ එක් තේමාවක් පිළිබඳ දක්වන සුවිශේෂත්වය වැනි කරුණු වලින් එකක් ලිවිය යුතුය. (ලකුණු 01)

(ii) ★ ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතිය (G. P. S)

★ භූගෝලීය තොරතුරු පද්ධතිය (G, I,S)

★ දුරස්ථ සංවේදය (R. S) (ලකුණු 03)

(iii) (a) ★ භෞතික ලක්ෂණ

★ සංස්කෘතික ලක්ෂණ (ලකුණු 02 යි)

(b) ★ භෞතික ලක්ෂණ හා ඒවා අතර අන්තර් සම්බන්ධතාව පිළිබඳ අවබෝධයක් ලබාගත හැකි වීම.

★ ජලවහන රටා හා භූ විෂමතාව අතර සම්බන්ධතාව පිළිබඳ අවබෝධයක් ලබාගත හැකි වීම.

★ භෞතික ලක්ෂණ හා මානව ක්‍රියාකාරකම් අතර සම්බන්ධතාව පැහැදිලි වීම.

★ භූමි පරිභෝග රටාව පිළිබඳ අදහසක් ලබාගත හැකි වීම.

★ ප්‍රදේශය පිළිබඳ සමස්ත අවබෝධයක් ලබාගත හැකි වීම.

★ සංවර්ධන කටයුතු සඳහා යොදා ගත හැකි වීම වැනි ලක්ෂණ දෙකක් ලියා පැහැදිලි කිරීමට (ලකුණු 03)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank